ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව.
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: **dcommunications@cbsl.lk, communications@cbsl.lk**
වෙබ් අඩවිය: **www.cbsl.gov.lk**

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| **නිකුත් කළේ** | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| **දිනය** | 2019 මාර්තු 15 |

## ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2019 පෙබරවාරි

නිෂ්පාදන ක්‍රියාකාරකම් අඩු වේගයකින් වර්ධනය වීම සඳහා 2019 ජනවාරි මාසයට සාපේක්ෂව 2019 පෙබරවාරි මාසයේදී, විශේෂයෙන්ම නිමි ඇඳුම් නිෂ්පාදන අංශයේ, නව ඇණවුම් සහ නිෂ්පාදනයෙහි දක්නට ලැබුණු මන්දගාමීත්වය හේතු විය. පෙබරවාරි මාසය තුළ රාජකාරී දින ගණන අඩු වීම මෙම මන්දගාමීත්වයට ප්‍රධාන වශයෙන් හේතු විය. නව ඇණවුම් සහ නිෂ්පාදනයෙහි සිදුවූ අඩු වීමට සමගාමීව තොග මිළදී ගැනීම් වල ද අඩු වීමක් දක්නට ලැබුණි.

**ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**
**50.6**
**2019 ජනවාරි මාසයට සාපේක්ෂව දර්ශකාංක 3.8 ක අඩු වීමකි.**

| විචල්‍යය | 2019 ජන. | 2019 පෙබ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **54.4** | **50.6** | **-** | **අඩු වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උප දර්ශක** | | |
| නව ඇණවුම් | 54.0 | 48.5 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| නිෂ්පාදන | 55.5 | 48.0 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 52.5 | 53.0 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ගැනුම් තොගය | 55.5 | 54.0 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 55.0 | 53.5 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

කෙසේ වුවත්, ඉදිරි උත්සව සමයේ ඉල්ලුමට සරිලන පරිදි නිෂ්පාදන ක්‍රියාවලිය වර්ධනය කර ගැනීමේ අරමුණින් කරන ලද නව බඳවාගැනීම් හේතුවෙන් රැකියා නියුක්තියෙහි සුළු වර්ධනයක් දක්නට ලැබුණි. මේ අතර, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලයෙහි සුළු වැඩි වීමක් දක්නට ලැබුණි. පෙබරවාරි මස මුල් භාගයේදී ඇතිවූ සැපයුම් ගෙන්වා ගැනීමේ ගැටළු සහ චීන අලුත් අවුරුදු නිවාඩු හේතුවෙන් ඇතිවූ බාධා, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලයෙහි වැඩි වීමට හේතු විය. නව ඇණවුම් සහ නිෂ්පාදනය යන උප දර්ශක හැරුණුකොට අනෙකුත් සියලුම උප දර්ශක, කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50.0 ට වඩා වැඩි අගයක් වාර්තා කරන ලදී.

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2019 ජනවාරි මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.1 කින් පහළ යමින් 2019 පෙබරවාරි මාසයේදී 50.6 ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

2019 පෙබරවාරි මාසයේදී, යුරෝපා කලාපය, එක්සත් රාජධානිය, එක්සත් ජනපදය සිංගප්පූරුව සහ රුසියාව නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයන්හි අඩුවීමක් පෙන්නුම් කළ අතර චීනය සහ ඉන්දියාව වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

*(මූලාශ්‍රය: මාකිට් [1] ආයතනය, 2019 මාර්තු 14 වන දිනට)*

[1] මාකිට් යනු ලොව ප්‍රධාන පෙළේ මූල්‍ය තොරතුරු සේවා ලබාදෙන ආයතනයකි. මෙය ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් *30* කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.

2019 පෙබරවාරි මාසයේ දී සේවා අංශය අඩු වේගයකින් වර්ධනය වූ අතර 2019 ජනවාරි මාසයට සාපේක්ෂව නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම්, සේවා නියුක්තිය සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම්වල සිදු වූ මන්දගාමී වර්ධනය ඊට හේතු විය. සේවා අංශය අඛණ්ඩව දෙමසක් ඉහළ වේගයකින් වර්ධනය වීමෙන් පසු මෙම මන්දගාමී වර්ධනය දැකිය හැකි විය.

තාක්ෂණික වැඩි දියුණු කිරීම් සහ අපනයන ප්‍රමාණය වර්ධනය වීම හේතුවෙන් ප්‍රධාන වශයෙන් මූල්‍ය සේවා සහ ප්‍රවාහන යන උප අංශවල ව්‍යාපාර ක්‍රියාකාරකම්වල වර්ධනයක් දැකිය හැකි විය. ව්‍යාපාර පරිසරයේ ඇති අවිනිශ්චිතතාව නිසා බොහෝ පිරිසක් කල් යල් බැලීම හේතුවෙන් නව ව්‍යාපාර සහ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල වර්ධනය මන්දගාමී විය. තවද, 2019 අය වැයෙන් යෝජනා කළ නව වාහන බදු සංශෝධන හේතුවෙන් තොග සහ සිල්ලර වෙළඳාම් උප කාණ්ඩයෙහි ව්‍යාපාර අපේක්ෂා පහළ යන ලදී. ව්‍යාපාර ක්‍රියාවලි ස්වයංකරණය සහ කෘතිම බුද්ධිය යොදා ගැනීමට යොමු වීම හේතුවෙන් සේවා නියුක්ති වර්ධනය පහළ යෑ හැකි බව ඇතැම් ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කර තිබුණි.

**ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**53.0**

**2019 ජනවාරි මාසයට සාපේක්ෂව දර්ශකාංක 2.8 ක අඩු වීමකි.**

සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

| විචල්‍යය | 2019 ජන. | 2019 පෙබ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **55.8** | **53.0** | **-** | **අඩු වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උප දර්ශක** | | |
| නව ව්‍යාපාර | 57.7 | 55.3 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 56.7 | 54.7 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 57.4 | 51.1 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 42.9 | 43.3 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 64.4 | 60.5 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සේවා අංශයේ අයකරන මිල ගණන් 2019 පෙබරවාරි මාසයේ දී අඩු වේගයකින් ඉහළ යන ලද අතර සේවා අංශයේ අපේක්ෂිත ශ්‍රම පිරිවැය ද අඩු වේගයකින් ඉහළ ගියේය.

**ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය**

ගෝලීය සේවා අංශයෙහි නිමැවුම් වර්ධන වේගයෙහි වැඩි වීමක් පෙන්නුම් කරමින් ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2019 ජනවාරි මාසයේ දී මාස 28 කින් වාර්තා වූ පහළම අගය වන 52.6 හි සිට පෙබරවාරි මාසයේ දී 53.3 දක්වා ඉහළ යන ලදී. පසුගිය මාස 115 තුළ ගෝලීය සේවා නිමැවුමෙහි වර්ධනයක් එමගින් පෙන්නුම් කරයි.

ජපානය, චීනය, එක්සත් රාජධානිය, ඉන්දියාව සහ ඇමරිකා එක්සත් ජනපදය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශ 2019 ජනවාරි මාසයට සාපේක්ෂව පෙබරවාරි මාසයේ දී වර්ධනය වූ බව පෙන්නුම් කරයි.

*(මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2019 මාර්තු 14 වන දිනට)*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව අවම වශයෙන් ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.